"ඔන්ලයින් පෙම්ලයින් වී සිසුවිය ගැබිනියක වෙලා" යන සිරස්තලය යටතේ ලංකාදීප පුවත්පතේ (12/21) පළවී තිබූ පුවත් වාර්තාවකි. මෙම පුවත් වාර්තාවේ අන්තර්ගතය අනුව සිදුවී ඇත්තේ වයස අවුරුදු 15 ක බාලවයස්කාර දැරියක් ලිංගික අපයෝජනයට ලක් කිරීමකි. මේ සම්බන්ධයෙන් වන අපගේ නිරීක්ෂණයන් මෙසේයි.

1) පෙම්සබඳතාවයක් ඔස්සේ සිදුවුවත්, බාලවයස්කාර දැරියක් හා ලිංගික සම්බන්ධතා පැවැත්වීම නීතිය තුළ දැක්වෙන්නේ ලිංගික අපයෝජනයක් යන වරද ලෙසිනි. එවැනි වරදක බරපතළ භාවය මෙම සිරස්තලය මගින් නොදැක්වෙන්නේ මන්ද? මෙම සිරස්තලය ඔස්සේ එම වරද සැහැල්ලු වීමක් සිදු නොවන්නේද?

2) මෙවැනි භාවාතිශය සිරස්තලයන් ඔස්සේ, සිදුවීම සමාජ ගැටළුවක් ලෙසින් ගැනීමේදී එහි ඇති සියුම් තොරතුරු පාඨකයාට ග්‍රහණය නොවී යන්නේ නැතිද?

3) මෙම ලිපියේ අන්තර්ගතය තුළ සිදුවීම "ස්ත්‍රී දූෂණයක්" ලෙසින් දැක්වේ. කෙසේ නමුත් දූෂණය යන යෙදුම ඔස්සේ වින්දිතයා අපවිත්‍ර වූ බවක් හැඟවීම සහ එම යෙදුම ඔස්සේ සමාජ කොන්කිරීමකට ලක් විය හැකි නිසා, මෙතැනදී වඩාත් උචිත යෙදුම වන්නේ ලිංගික අපයෝජනය යන්නයි.

මේ සම්බන්ධයෙන් ඔබේ අදහස් මොනවාද?

**#MediaEthicsSL #lka #SinhalaPress#Lankadeepa**